# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

3 ශ්‍රේණිය -බුද්ධ ධර්මය - 2022 ජනවාරි - 01 වන සතිය

සැකසුම :- බලංගොඩ අධ්‍යාපන කලාපය.
ප්‍රා. ගුරු උපදේශිකා :- මල්ලිකා රත්නායක

- පුංචි දුවේ පුතේ අලුත් අවුරුද්දේ අලුත් පන්තියකට ආවා නේද?
- අද අපි 3 ශ්‍රේණිය බුද්ධාගම පොතේ පළමු පාඩම කියවමු.
- හොදයි දුවේ පුතේ පළමු වන පාඩම කියවන්න පටන් ගන්න. වැඩිහිටියන්ගේ උදවු ලබා ගන්න.
- පුංචි පුතේ, දුවේ , සිදුහත් කුමාරයාට පියරජතුමා වැදපු දෙවන අවස්ථාව ගැන තමයි පාඩමෙන් කියවෙන්නෙ.

1.පිය රජතුමා වැදපු පළමු අවස්ථාව ගැන කතාව වැඩිහිටියන්ගෙන් අසා දැන ගන්න.

2.පුංචි කුමරයාගේ මව හා පියාට කියන නම් වැඩිහිටියන්ගෙන් අසා දැන ගන්න.

3.බෝසත් කුමාරයාගේ පියා රජ කළ නුවරට කියන නම කියන්න.

4.බෝසත් කුමාරයාගේ නම කියන්න.

5.සුද්ධෝදන මහ රජතුමා සහභාගි වූයේ කුමන උත්සවයටදැයි කියන්න.

"අපි හොදින් ඉගෙන ගනිමු"

**“හොදයි ආදරණීය දුවේ, පුතේ ඔයාලට තෙරුවන් සරණයි!”**